ඇඹිලිපිටිය නගර සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ දක්වා ඇති සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 6,403,435 ක් වුවත්, සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණේ රු. 15,159,172 ක්වූ ප්‍රධාන ලෙජරයේ පිළියෙල කර තිබූ සිහිවටන ලෙජර් ගිණුමේ ශේෂය විය.

(ආ) රු. 234,263 ක්වූ දුන් වට්ටම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යටතේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී තැන්පත් කල නමුත් අඟරු වූ චෙක්පත් වටිනාකම වූ රු. 296,046 ක්, මූල්‍ය ප්‍රකාශන යටතේ වියදම වැඩිවීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වසරේ විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති කල්බදු මඟින් ලබාගත් කැබ් රථයේ ණය වටිනාකම වූ රු. 7,750,000 ක් ගිණුම්ගත කිරීමේදී සිදු වූ වරද සමාලෝචිත වර්ෂය තුල නිවැරදි කිරීමේදී ජ'නල් සටහන් අංක 16 යටතේ සමුච්චිත අරමුදල් ගිණුමට බැර කරනු වෙනුවට සිහිවටන ආදායම් හා වියදම් ගිණුමට සටහන් කර තිබුණි.

(ඉ) කල්බදු යටතේ මිලදී ගත් කැබ් රථය වෙනුවෙන් ගෙවන ලද රු. 1,029,763 ක්වූ ණය වාරික මුදල් ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කර තිබූ අතර, රු. 1,155,401 ක්වූ පොලී මුදල් හා බදු මුදල් ගෙවීමද ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු රු. 2,971,840 ක් වුවද, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන මඟින් රු. 2,311,842 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු රු. 659,998 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ උසාවි දඩ රු. 1,631,791 ක් වුවද, උසාවි දඩ හිඟ ආදායම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන මඟින් රු. 2,208,798 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ උසාවි දඩ රු. 577,007 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු. 21,629,722 ක් වුවද, ලෙජර් ගිණුම අනුව එම ශේෂය රු. 14,217,482 ක් වූයෙන් බාහිර වගකීම් රු. 7,412,240 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු හිඟ පොලිය රු. 2,558,512 ක් වුවද, ණයහිමියන් යටතේ රු. 294,338 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම රු. 2,264,174 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) බස් නැවතුම්පල බස්රථ නැවතුම් ගාස්තු අයකිරීම සඳහා රු. 2,000,100 ක මුදලකට ටෙන්ඩර් ලබා දී තිබුණද, උක්ත ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 1,485,285 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
| --- | --- | --- |
| | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 371(2) | වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු. 1,142,679 ක්වූ අත්තිකාරම් ආපසු පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 570 සහ 571 | 1999 වර්ෂයේ සිට පැවතෙන රු. 3,148,327 ක තැන්පත් සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,178,284 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,744,440 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 8,433,844 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 66 ක වැඩිවීමක් විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදුකුලී, වරෙන්තු ගාස්තු හා දඩ සහ වෙනත් ආදායම් වල පිළිවෙලින් සියයට 59, සියයට 117, හා සියයට 299 ක වැඩිවීම හා ගමන් වියදම් සහ විශ්‍රාම වැටුප් වල පිළිවෙලින් සියයට 56, හා සියයට 32 ක අඩුවීමකි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 18,374 | 17,869 | 29,339 |
| බදු කුලී | 9,958 | 11,325 | - |
| බලපත්‍ර ගාස්තු | 3,492 | 1,447 | - |
| වෙනත් ආදායම් | 8,699 | 8,247 | 6,005 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්හි රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 35, සියයට 58, සියයට 06, සියයට 78, හා සියයට 15 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට සභාව වෙත අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල රු. 29,264,017 ක්වූ අතර, හිඟ වරිපනම් බදු ශේෂය වාර්ෂිකව වැඩිවන තත්ත්වයක් පෙන්නුම් කෙරිණ.

2.3.4 බලපත්‍ර ගාස්තු

---------------

2014 නොවැම්බර් 21 දිනැති අංක 1890 දිනැති ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපාර බලපත්‍ර අප්‍රේල් මස 30 වන දිනට පෙර ලබා ගතයුතු වුවද, විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූලි මස වනවිටත් ව්‍යාපාර බලපත්‍ර ලබා ගැනීමේ හිඟහිටි අවස්ථා 51 ක්ද, 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ බදු අයකිරීම් වල හිඟහිටි අවස්ථා 104 ක්ද නිරීක්ෂණය විය.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති ප්‍රසිද්ධ දැන්වීම් පුවරු 15 ක් සඳහා අදාල ගාස්තු ගෙවීම් කර නැවත අළුත් කර ගැනීමේ කාල සීමාව කල්පිරී තිබුණද, නැවත ගාස්තු ගෙවා කාල සීමාව දීර්ඝ කරගෙන නොමැති අතර, ඒ හේතුවෙන් සභාවට අහිමි වී ඇති ආදායම රු. 62,600 ක් විය. ගාස්තු අයකල හැකි දැන්වීම් පුවරු හඳුනාගෙන එමඟින් අදාල බදු මුදල් අයකරගත යුතු වුවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු බස් නැවතුම්පල සඳහා බස් රථගාල් ගාස්තු අයකිරීම සඳහා 2014 වර්ෂය තුල ටෙන්ඩර් කැඳවා බදු දීම සිදු කලද, අදාල බදුකරු එම කාර්යය අතහැර ගොස් ඇති බැවින් බස් රථ වලින් ගාස්තු අයකිරීම සිදු නොවන බව නිරීක්ෂණය විය.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

2014 මැයි 01 සිට 2015 පෙබරවාරි 27 දින දක්වා ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 787,687 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණද, එම මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයක් දක්නට තිබුණි.

2.3.7 පොදු වෙළඳපල කඩකාමර බදු

------------------------------------

(අ) නවනගරයේ සතිපොල භූමියේ වෙළඳ සංකීර්ණයේ කඩකාමර 32 කට අදාල ගිවිසුම් ඇප ලෙස රු. 126,000 ක් තැන්පත් කර නොතිබූ අතර, කඩ බදුකරුවන් 17 ක් විසින් සම්පූර්ණ ඇප මුදල වන රු. 100,000 වෙනුවට රු. 25,000 ක් බැගින් ඇප ලෙස තැන්පත් කර තිබුණි.

(ආ) පොදු වෙළඳපල කඩකාමර 08 ක් සඳහා බදු ගැනුම්කරුවන් ගෙන් 2013 ජුලි 14 දින සිට 2015 ජුනි දක්වා කුලිය ලෙස රු. 444,500 ක් අයවීමට තිබුණි. විධිමත් පරිදි ගිවිසුම්ගත නොවූ හා දිගින් දිගටම ගෙවීම් පැහැරහැර ඇති යථෝක්ත කඩ බදුකරුවන්ට එරෙහිව කටයුතු කිරීමත්, ඔවුන් වෙතින් සන්තකය ආපසු ගැනීමත්, දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි.

(ඇ) පල්ලේගම පොදු වෙළඳපලේ කඩකාමර 59 කින් සභාව විසින් වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීම මඟින් වෙළඳ අයිතිය බදුදෙන කඩ සංඛ්‍යාව 04 ක් පමණක් වන අතර, ගිවිසුම්ගතවී නොමැති කඩබදුකරුවන් සංඛ්‍යාව 32 ක් විය. මෙකී කඩ බදුකරුවන් තම බදු කුලී ගෙවීම දිගින් දිගටම පැහැර හැර ඇති බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අහිමි වී ඇති ආදායම රු. 1,253,300 ක් විය.

(ඈ) බස් නැවතුම් පරිශ්‍රයේ ඉදිකල තාවකාලික කඩකාමර 40 කින් 32 දෙදෙනෙකු ගිවිසුමකට එළඹ නොතිබූ අතර, කඩහිමියන් 36 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 2,215,500 ක් හිඟ කුලී අයවීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

නගර සභාවේ මන්ත්‍රීවරුන් හා ලේකම්තුමිය තායිලන්තයේ විදේශ සංචාරයක යෙදීම වෙනුවෙන් අත්තිකාරම් ලෙස පෞද්ගලික ආයතනයකට 2013 ජුලි 04 දින රු. 210,000 ක් ගෙවීම් කර තිබුණද, එම සංචාරය ක්‍රියාත්මක කර නොමැති අතර, අත්තිකාරම් ලෙස එම මුදල ලබා දී වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත්, ආපසු අයකර ගැනීම හෝ නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-------------------------

(අ) පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා ගමන් වියදම් ගෙවීමේදී ආයතනයේ පරිපාලන කටයුතු වලට ඍජුවම සම්බන්ධ රාජකාරී කටයුතු ඉටු කිරීම වෙනුවෙන් බල ප්‍රදේශයෙන් පිටත ගිය ගමන් බිමන් සඳහා පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකි බව පළාත් පාලන කොමසාරිස්ගේ 2009 දෙසැම්බර් 22 දිනැති අංක ප.පා.කො.1/2009 (සංශෝධන) දරන චක්‍රලේඛය මඟින් අවධාරණය කර ඇතත්, තම රාජකාරිය හෝ රාජකාරිය පිළිබඳ කිසිඳු තහවුරු කිරීමකින් තොරව 2011, 2012, 2013 හා 2014 වර්ෂ වල සංයුක්ත දීමනා වශයෙන් රු. 63,750 ක් සභාපතිවරයාට ගෙවා තිබුණි. තවද, ඉහත වියදම් දැරීමේදී අදාල වර්ෂයන් සඳහා වියදම් ණයහිමියන් යටතේ හෝ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

(ආ) 2011, 2012 හා 2013 වර්ෂයන් සඳහා ගමන් වියදම් දීමනා වශයෙන් සභාපතිවරයාගේ රියදුරුට රු. 35,848 ක් ගෙවා තිබූ අතර, පළාත් පාලන ආයතන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම පිළිබඳ 2009 ඔක්තෝබර් 07 දිනැති අංක 2/2009 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට අනුව නගර සභා රියදුරෙකුට ලබාදිය හැකි දින ගණන මසකට දින 06 කි. එකී විධිවිධානය නොසලකා පසුගිය වර්ෂයන්ට අදාලව ප්‍රතිපාදන සලසා ගැනීමකින්ද තොරව 11421 වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ජූනි 26 දින මාස 03 ක කාලයක් සඳහා රු. 981,418 ක පිරිවැයකට ගිවිසුම්ගතව තිබූ නගර සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල නවනගරය දකුණු ඇල සිට නවනගරය පාලම දක්වා මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූනි මස වනවිටත් බොරළු කියුබ් 10 ක් පමණක් වැඩ බිමට ගෙනවිත් දමා තිබූ බවත්, මාර්ගයේ පස් පුරවා උස් කල යුතු කොටස් වෙනුවෙන් ඇස්තමේන්තු කර කර්මාන්තයේ වැඩ නිම කිරීම සඳහා සභාවේ අවදානය යොමු වී නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද, මෙකී කර්මාන්තය සඳහා 2013 ජූලි 29 දින ලබා දී තිබූ රු. 190,000 ක්වූ අත්තිකාරම් මුදලද පියවා නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු. 469,931 ක්වූ නගර සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල නවනගරය දකුණු ඇල සිට නවනගරය පාලම දක්වා බෝක්කු ඉදිකිරීම කර්මාන්තය සඳහා රු. 387,008 ක් 2014 ඔක්තෝබර් 27 දින ගෙවීම් කර තිබුණි. බෝක්කු නිසි පරිදි පස් පුරවා එම කාර්යය විධිමත් පරිදි නිම කර නොමැති බවත්, එකී බෝක්කු ඉදිකිරීමේ කිසිඳු ප්‍රයෝජනයක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූනි මස වනවිටද අත්වී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඇ) නගර සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ගිවිසුම්ගත වටිනාකම රු. 966,894 ක්වූ දර්ශනගම වැව පාර බොරළු යොදා වැඩිදියුණු කිරීම කර්මාන්තයට අදාලව ඉටු නොකරන ලද මීටර් 100 ක දිගින් යුත් වැඩ කොටසක් වෙනුවෙන් 2014 මාර්තු 10 දින රු. 69,046 ක ගෙවීමක් හා විධිමත් පරිදි සංවර්ධනය නොකරන ලද මීටර් 400 ක ප්‍රමාණයට අදාලව ගෙවන ලද රු. 276,183 ක ගෙවීමක් සම්බන්ධයෙන් විගණනයට එකඟ විය නොහැක.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභා බල ප්‍රදේශයේ එකතු වන කැලිකසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ අරමුණින් සැලසුම් කරමින් පවතින කඳුරුගස්ආර කසල ව්‍යාපෘතියේ කසල අංගනයේ සිට ලීචේට් ජලය රඳවන ටැංකිය දක්වා ලිචේට් ජලය ගලායන කාණුව ඉදිකර නොමැති බවත්, අංගනයේ වහලයට සෙවිලි කල තහඩු ගැලවී ගොස් ඇති බවත්, බල ප්‍රදේශය තුල එකතුවන කැලිකසල ඇඹිලිපිටිය කඩදාසි කම්හල් භූමියේ විවෘත භූමි භාගයක බැහැර කරන බවත් 2015 ජූලි 06 දින කරන ලද භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය